# අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# සබරගමුව පළාත් සභාව

# විදුහල්පති තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම - 2024

පහත සඳහන් කොන්දේසි වලට අදාළ ව දැනට පුරප්පාඩු පවතින පාසල් වල (ඇමුණුම් අංක 1) විදුහල්පති තනතුර සඳහා අයදුම්පත් කැඳවීමට අදාළ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

02. ඒ අනුව දැනට පුරප්පාඩු වී ඇති ඇමුණුම් අංක 1 හි සඳහන් පාසල් වල විදුහල්පති තනතුර සඳහා සුදුසුකම්ලත් සබරගමුව පළාතේ දැනට සේවයේ නියුතු, 2023.12.31 දිනට වයස අවුරුදු 57ට අඩු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I,II හා III ශ්‍රේණි වල නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

03. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර දැනට සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව 2024/01/12 දිනට පෙර ලේකම් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, ඉල්ලුම් කරන විද්‍යාලයේ නම හා තනතුර සඳහන් කළ යුතුය.

04. අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර සහ නියමිත ආකෘතියෙන් බැහැරව ඉදිරිපත් කරන අයදුම්පත්‍ර පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්පත්‍ර ලැබීමෙන් පසුව පැවැත්වෙන විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් ලකුණු ලබා දීමෙන් අනතුරුව සුදුසු අය තෝරා පත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.අදාළ අයදුම්පත්‍රය www.moe.sg.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

බී.ඒ.සී.පී. බමුණුආරච්චි,

ලේකම්,

අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,

සබරගමුව පළාත් සභාව.

2023/12/27